සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



A

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - I

13 ශ්‍රේණිය

කාලය පැය 01 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර දී ඇති වරණ තුළින් තෝරා වරහන් තුළ ලියා දක්වන්න.

---

01 ''ප්‍රේක්ෂාව'' යන්නට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) නාට්‍ය නරඹන පිරිසයි.
(2) ප්‍රේක්ෂකයා සතු වගකීමයි
(3) වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශනයයි.
(4) නාට්‍යයේ පෙළ ගැස්මයි.
(5) නළුවන්ගේ රූපණයයි. (........)

02 ප්‍රාසාංගික කලා යනු,
(1) හුදු රිද්මයානුකූල නර්තනයයි.
(2) අනුශාංගික අංග අල්පව භාවිතා කරයි.
(3) සජීවීව ඉදිරිපත් කරන කලාවකි.
(4) රිද්මයානුකූල නර්තනයයි.
(5) ශ්‍රව්‍ය ගෝචර කලාවකි. (........)

03 ග්‍රීක සුඛාන්ත නාට්‍ය,
(1) කථා නායකයා අවසානයේ තම දුර්ගුණ හේතුවෙන් ව්‍යවසනයට ලක්වේ.
(2) මෙහි පරමාර්ථය විනෝදාස්වාදයයි.
(3) ඇරිස්ටෝටල් මෙහි පුරෝගාමියාය.
(4) දියෝනීසස් දෙවියන් වෙනුවෙන් කරන ලද පූජාරථා විධියකි.
(5) ඇරිස්ටෝෆනීස් මෙම නාට්‍යයේ පුරෝගාමියෙකි. (........)

04 සංස්කෘත නාට්‍යයේ විශේෂ ලක්ෂණයකි.
(1) රඟපෑම සඳහා පිරිමින් පමණක් යොදාගනී.
(2) ගද්‍ය පද්‍ය මිශ්‍රණයකි.
(3) 'අලංකාර ' යනු වේෂ භූෂණයයි.
(4) නාට්‍ය ධර්මී රංග ශෛලිය යොදාගනී.
(5) නර්තනය බහුලව යොදාගනී. (........)

05 ඇරිස්ටොටල් ට්‍රැජඩියේ වැදගත්ම අංගයක් ලෙස සැලකුනේ,
(1) චරිත නිරූපණයයි. (2) ප්‍රේක්ෂාවයි.
(3) කථා වින්‍යාසයයි. (4) චින්තනයයි.
(5) වාග් විලාශයයි. (........)

06 රූපණය වනාහි ,
(1) චරිතයකට ආවේශ වීමයි. (2) චරිතයක් අනුකරණයයි.
(3) නළුවාගේ සාමූහිකත්වය ඇගයීමයි. (4) සජීවීව චරිත ඉදිරිපත් කිරීමයි.
(5) කථාවකට අනුව රංගනයයි. (........)

07 මුවින් ගීත ගයන්නීය, හස්තයෙන් අර්ථ ප්‍රකට කරන්නීය.... යනුවෙන් සඳහන් වන්නේ,
(1) කෘදන්ත රංග පිළිබඳවයි. (2) නාට්‍ය පිළිබඳවයි.
(3) නෘත්‍ය රංග පිළිබඳවයි. (4) නර්තනය පිළිබඳවයි.
(5) ක්ෂණික නිරූපණ පිළිබඳවයි. (........)

08 නාට්‍ය ධර්මී ලක්ෂණයන්ගෙන් පොහොසත් වූ නාට්‍යයකි.
(1) ඔතෙලෝ (2) රුකඩ ගෙදර (3) ජූලියස් සීසර්
(4) ශාකුංතලය (5) සුභ සහ යස (........)

09 කලාව යන්නට වඩාත් ගැලපෙන ප්‍රකාශය,
(1) සාමූහික ප්‍රයත්නයක ඵලයකි.
(2) නර්තනය, ගායනය, වාදනය, ආදියෙන් යුකත් වුවකි.
(3) කලාව වනාහි කලින් කලට වෙනස් වෙයි.
(4) මිනිස් ක්‍රියාවලියෙහි ඵලයකි.
(5) කිසියම් සිද්ධියක් පාදක කොට ගත්තකි. (........)

- අංක 10 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට පහත සංවාද / ගීත ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A මට නැත දූන් ජීවයක්
කැටුව යනු මම මෙතැනින්

B පුරාසඳ මඬලෙන් බසින ඇතාණෝ
සත් කුලු පව්වට නඟින ඇතාණෝ

C ඒ රහස ... මගේ සතුටත් ආඩම්බරයත් වෙනුවෙන් තිබුණ එකම වාසිය. ආහ් .. ඉවරයි. එයා මේක දැනගත්තොත්

D මියුලැසි සොඳුරිය අවදිකරද්දි පසුවුයෙමි මම නින්දට පිවිස

E අහෝ ශාප ලැබූ අධමයා... මට එය භාර දීපල්ලා

F අපි ඔක්කොම මත්වෙලා, අර්ථයෙන් මත්වෙලා, ධර්මයෙන් මත්වෙලා

10 A අක්‍ෂරයෙන් කියැවෙන සංවාද ඇතුලත් නාටය .
(1) ඇන්ටිගනී (2) ඊඩිපස් රජ (3) ජූලියස් සීසර්
(4) ඔතෙලෝ (5) සුභ සහ යස (........)

11 B අක්‍ෂරයෙන් දක්වා ඇත්තේ,
(1) මනමේ නාට්‍යයේ ගීතයකි. (2) සුබ සහ යස නාට්‍යයේ ගීතයකි.
(3) සිංහබාහු නාට්‍යයේ ගීතයකි. (4) හස්තිකාන්ත මන්තරේ නාටය ගීතයකි.
(5) ශාකුංතලා නාට්‍යයේ ගීතයකි. (........)

12 ඉහත දැක්වූ නාට්‍යයෙහි රචකයා
(1) හෙන්රික් ඉබ්සන් ය. (2) සයිමන් නවගත්තේගම ය.
(3) එදිරිවීර සරච්චන්ද්‍ර ය. (4) කාලිදාස ය.
(5) හෙන්රි ජයසේන ය. (........)

13 C අක්‍ෂරයෙන් දැක්වෙන නාට්‍ය නිර්මාණය,
(1) වැනීසියේ වෙළෙන්දා (2) චෙරිවත්ත (3) වනතාරවී
(4) රුකඩ ගෙදර (5) හුණුවටය (........)

14 එම නාට්‍ය නිර්මාණයෙහි රචකයා වන්නේ,
(1) විලියම් ෂේක්ශ්පියර් (2) නිකලොයි ගොගොල් (3) එමිලි කෝලා
(4) ඇන්ටන් චෙකොෆ් (5) හෙන්රික් ඉබ්සන් (........)

15 රුකඩ ගෙදර නාට්‍ය නිර්මාණය අයත් රංග රීතිය ලෙස,
(1) ස්වභාවික වාදය (2) නාට්‍ය ධර්මී (3) ලෝක ධර්මී
(4) රොමැන්ටික වාදය (5) යතාර්ථ වාදය (........)

16 D අක්‍ෂරයෙන් කියැවෙන පදය කියනු ලබන්නේ,
(1) උදයන රජු ය. (2) සුභ ය. (3) යස ය.
(4) දුෂ්‍යන්ත රජු ය. (5) කාලිදාසය. (........)

17 E සංවාදය අයත් නාට්‍ය නිර්මාණය,
(1) ඔතෙලො (2) ඇන්ටිගනී (3) ජූලියස් සීසර්
(4) රුකඩ ගෙදර (5) ඊඩිපස් රජ (........)

18 ඉහත නාටය නිර්මාණයේ නිර්මාණකරුවා,

(1) ඇන්ටන් චෙකොෆ් (2) විලියම් ශේක්ෂ්පියර් (3) සොෆෝක්ලීස්

(4) හෙන්රික් ඉබ්සන් (5) එමිල් සෝලා (........)

19 F අක්ෂරයෙන් කියැවෙන සංවාද ඇතුලත් නාටය .

(1) සුභ සහ යස (2) හස්තිකාන්ත මන්තරේ (3) ඔතෙලෝ

(4) ශාකුන්තලා (5) ඇන්ටිගනී (........)

20 ග්‍රීක නාට්‍ය හා සම්බන්ධ ' භාව විශෝධනය ' යනු ,

(1) තාරුණ්‍ය හා එය තුරන් කිරීමයි.

(2) ප්‍රේක්ෂකයා තුළ ඇතිවන සිතුවිල්ලකි.

(3) කතාවස්තුව තුළ වූ ප්‍රත්‍යාවර්තනය හේතුවෙන් ඇතිවන්නකි.

(4) නළුවා තුළ වූ භාව ප්‍රකාශ කිරීමයි.

(5) භාව අනුභව කිරීමයි.

21 ආංගික අභිනයේ ප්‍රභේදයකි.

(1) ප්‍රලය (2) අලංකාර (3) නාරී

(4) ස්වේද (5) අශ්‍රු

22 එක් ස්ථානයකට පමණක් ආලෝක කරාව යොමු කරන පහන් වර්ගයකි.

(1) යොමු පහන් (2) ධාරාලෝක පහන් (3) වර්ණචක්‍රය

(4) ස්ට්‍රොබ් පහන් (5) ඩිමරය

23 අල්ට්‍රාවයලට් පහන මගින් කෙරෙන කාර්‍යභාරය ලෙස,

(1) ගගනිකාව ආලෝකමත් කිරීමයි.

(2) අවස්ථා තීව්‍ර කිරීමට යොදාගත හැකි ය.

(3) වර්ණවත් ආලෝකයක් ලබාගත හැකි ය.

(4) වේදිකාවේ කොටසක් පමණක් ආලෝකමත් කළ හැකි ය.

(5) නළුවා ගමන් කරන විට ඒ දෙසට එක එල්ලේම යොමුකළ හැකි ය.

24 බ්ලැකවුට් (Black - out) යන්නෙන් අදහස් වන්නේ,

(1) වේදිකාව සම්පූර්ණයෙන් ම අඳුරු කිරීමයි.

(2) සම්පූර්ණ වේදිකාවම ආලෝකමත් කිරීමයි.

(3) ඍජුව පතිත කළ හැකි ආලෝකයයි.

(4) පිටුපස සුදු තිරය ආලෝක කිරීමයි.

(5) අර්ථය ප්‍රකාශ කළ නොහැකි ලෙස ආලෝකය යොදා ගැනීමයි.

25 මනමේ නාට්‍ය නිර්මාණය වූ කාලය ලෙස,

(1) 1956 දීය. (2) 1952 දීය. (3) 1954 දීය.

(4) 1957 දීය. (5) 1961 දීය.

26 දේශීය නාට්‍ය ඉතිහාසයේ සන්ධිස්ථානයකට පත් කරන ලද විකෘති නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(1) සුගතපාල ද සිල්වා (2) සෝමලතා සුභසිංහ

(3) නන්දන අල්ගෙවත්ත (4) කේ. බී. හේරත්

(5) ගුණසේන ගලප්පත්ති

27 ''වාර්තා රංගය'' හඳුන්වා දෙන ලද්දේ,

(1) ජයලත් මනෝරත්න (2) දයානන්ද ගුණවර්ධන

(3) සුගතපාල ද සිල්වා (4) හෙන්රි ජයසේන

(5) ආර්. ආර්. සමරකෝන්

28 1961 දී උම්මග්ග ජාතකය ඇසුරෙන් නිර්මාණය වූ නාට්‍යයකි,

(1) මනමේ (2) සිංහබාහු (3) මහාසාර

(4) කාලගෝල (5) ඒකට මට හිනා හිනා

The National e-learning Portal for The General Education

29 නවරාත්‍රී මංගල්‍යයක් හා සම්බන්ධ නාට්‍යමය ලක්ෂණ සහිත උත්සවයකි.

(1) සුරන් පෝ (2) වර්ටෙයික් තිරුවලා (3) ජල්ලියක් කට්ටු

(4) තාලම්පූර් (5) වාඩු පොංගල්

30 වන්නි කලාපයේ පැවැති නාට්‍යයකි.

(1) වඩමෝඩි (2) තෙන් මෝඩි (3) කෝවලන්

(4) යාල්පාන කුත්තු (5) තෙන් පාත්කු

31 උඩරට ප්‍රචලිත දමිළ නාට්‍ය විශේෂය,

(1) අර්ජුනන් තපසු (2) වාසකප්ප (3) මහීඩි

(4) විලාසම් (5) වාලවීමන්

32 ''වඩමෝඩි'' වේදිකාව හඳුන්වන්නේ,

(1) කල රි (2) වෙල්ල කිට්ටර (3) වෙන්බා

(4) සබය (5) විරුක්කම්

33 වඩමෝඩි ගීත රචනා කර ඇත්තේ,

(1) වෙල්ල කට්ටර (2) වෙන්බා (3) විරුක්කම්

(4) කෝල් (5) විලාප

34 ගැඹුරු දේශපාලන තේමාවන් වස්තු විෂය කොට ගනිමින් නිෂ්පාදිත කණපතිපිල්ලෙයිගේ නාට්‍ය නිර්මාණයකි.

(1) උඩයාර් පඩික්කු (2) ද්‍රෝහියා (3) රාවනේසන්

(4) සංකරම් (5) බව ගිණි දල්වූවා

35 බ්‍රෙෂ්ට්ගේ අභූතරූපී නාට්‍ය සම්ප්‍රදාය අනුව යමින් නිර්මාණය වූ ශන්මුගලිංගම් ගේ නාට්‍යයකි.

(1) අන්නයි ඉට්ට කී (2) චන්සුමන්ත වේනියාර්

(3) එන්තායියුම් තායුම් (4) සංකරම්

(5) රාමනේසන්

36 ස්වාභාවික වාදයේ පුරෝගාමී නාට්‍යකරුවෙකි.

(1) ඇන්ටන් චෙකොෆ් (2) බර්නාඩ් ෂෝ

(3) බ්‍රෙටෝල්ට් බ්‍රෙෂ්ට් (4) එමිල් කෝලා

(5) හෙන්රි බෙක්

37 යථාර්ථවාදී රංගරීතිය හඳුන්වාදෙන ලද්දේ,

(1) වැනීසියේ වෙළෙන්දා කෘතියෙනි. (2) අම්මා කෘතියෙනි.

(3) සමාජකුලුනු කෘතියෙනි. (4) ඩෝල්ස් හවුස් නාට්‍යයෙනි.

(5) චෙරිවත්ත කෘතියෙනි.

38 ලොව බිහි වූ ප්‍රථම නළුවා,

(1) ඇරිස්ටෝටල් (2) භරතමුනි (3) ස්ටැනිස්ලාව්ස්කි

(4) ඇරිස්ටොෆානිත් (5) තෙන්ජිස්

39 ග්‍රීක නාට්‍යයේ විවෙසින් යනුවෙන් හැඳින්වූයේ

(1) නාට්‍යෝපකරණයි. (2) නාට්‍ය පිටපතයි.

(3) ප්‍රධාන නළුවායි (4) අනුකරණයයි.

(5) අංගරචනයයි.

40 ලංකාවේ සම්භාව්‍ය ඉංග්‍රීසි නාට්‍යකලාව බිහිකිරීමෙහි ලා පුරෝගාමියෙකි.

(1) රංජනී ඔබේසේකර (2) රුවන්ති චිගේරා

(3) ඊ. එෆ්. සී. ලුඩෝවයික් (4) නියුමන් ජුබාල්

(5) ජෙරොම් ද සිල්වා

( ල. 1x 40 = 40 යි)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



A

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

- **A හා B කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

## A කොටස

01 (1) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ශාන්ති කර්ම 02 ක් බැගින් නම් කරන්න. (ල. 04)

(2) එයින් එකක නාට්‍යමය අවස්ථාවක් පැහැදිලි කරන්න. (ල. 05)

(3) සබරගමු ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්ති කර්මයක් නම්කර විස්තර කරන්න. (ල. 06)

02 (01) නාඩගමෙහි මූලික ලක්ෂණ පහදන්න. (ල.04)

(02) නූර්ති ජනප්‍රිය වීමට හේතු දක්වන්න. (ල. 05)

(03) නූතන නාට්‍ය කලාවට නූර්තිවල බලපෑම පිළිබඳ කෙටියෙන් දක්වන්න. (ල. 06)

03 (1) හස්තිකාන්ත මන්තරේ නාට්‍යයට පදනම් වූ මූලාශ්‍රය දක්වන්න.

(2) එම නාට්‍යයේ කතා පවසන පරිදිම සංස්කෘත නාට්‍ය මූලාශ්‍රයෙන් එය වෙනස්වන අයුරු පහදන්න.

(3) එම නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳව පහදන්න. (ල. 15)

## B කොටස

04 (1) අධ්‍යක්ෂණය යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?

(2) අධ්‍යක්ෂවරයෙකු සතු ගුණාංග කවරේද?

(3) ඔබට නාට්‍ය නිර්මාණයක අංගරචනා කාර්ය පැවරුණහොත් එහි දී අනුගමනය කරනු ලබන පිළිවෙල ලියා දක්වන්න. (ල. 15)

05 (1) යථාර්තවාදී රංගරීතියේ පුරෝගාමීන් නම් කරන්න (ල. 04)

(2) රූකඩ ගෙදර නාට්‍යයෙහි අනුගත පශ්චාත් දෘෂ්ඨී කථන ක්‍රමය පැහැදිලි කරන්න. (ල. 05)

(3) රූකඩ ගෙදර නාට්‍යයේ භාවිතාවන සංකේත එකී නාට්‍යයේ රංගකාර්යටට කෙතරම්දුරට බලපා ඇත්දැයි සාකච්ඡා කරන්න. (ල. 06)

06 (1) එංගලන්තයේ ජන වන්දනා නාට්‍ය බිහිවීමට හේතු පහදන්න. (ල. 04)

(2) ජන වන්දනා නාට්‍ය ගණයට අයත්වන නාට්‍ය ප්‍රභේද නම් කරන්න. (ල. 05)

(3) එකී නාට්‍ය මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් වූ අයුරු පහදන්න. (ල. 06)

(15 x 4 = 60)